Department of Education,Sabaragamuwa Province/ Weekly School

01) පාඩම හෝ ඒකකය - 7.3.1. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නිර්මාණ අගයමු

02) ඉගෙනුම් ඵල -

- ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වී ඇති සුවිශේෂී කලා කෘති සොයා බලයි.
- ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණ එක්රැස් කරන්න.
- එම නිර්මාණ පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වී ඇති සුවිශේෂී කලා කෘති වන මූර්ති හා කැටයම් නම් කරන්න.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලා එවායෙහි නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම පිළිබද වෙබෝධයක් ලබා ගන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

**<u>කාර්ය පත්‍රිකාව</u>**

01) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ ඓතිහාසික පසුබිම හා භූගෝලීය පිහිටීම කෙටියෙන් පැහැදිලි කරන්න.

02) ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කර එක් එක් නිර්මාණ පිළිබඳ පහත කරුණු ඔස්සේ ඇගයීමක් කරන්න.

- යුගය සහ කාලය
- හමුවන ස්ථානය
- මාධ්‍යය
- ශිල්ප ක්‍රමය
- කලාත්මක ලක්ෂණ

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=x15PlOQLqDI
  https://www.youtube.com/watch?v=l1cU1w4jmgQ
  https://www.youtube.com/watch?v=TR6VaU8EHdg
  https://www.youtube.com/watch?v=LNgRfumBjPI
  https://www.youtube.com/watch?v=ZmJfj7mOmDQ
  https://www.youtube.com/watch?v=DTLIBaLE6GY
  https://www.youtube.com/watch?v=bb3ejK_LS-E
- කියවීම් පත්‍රිකාව -

- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මෙසපොටේමියානු, මිසර වැනි පූර්ව ඓතිහාසික උසස් ශිෂ්ටාචාර හා සම තත්ත්වයේ ලා සැලකිය හැකි ය. පුරා විද්‍යාඥ ශ්‍රීමත් ජෝන් මාෂල්ගේ විශ්වාසය වූයේ
- මෙම ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 3250 - 2750 අතර කාල වකවානුවට අයත් බව ය. එම ශිෂ්ටාචාරයේ ස්වර්ණමය කාලය ක්‍රි.පූ. 2500 - 1500 අතර වශයෙන් ඉන්දියානු පුරා විද්‍යාඥයින් විසින් දක්වයි.
- මොහෙන්ජොදාරෝ හා හරප්පා ශිෂ්ටාචාරයට අයත් නගර වැසියන් උසස් කලා කෞශලයෙන් යුක්ත ජන කොටසක් බව කැණීම්වලදී හමු වූ ද්‍රව්‍ය හා මෙවලම්වලින් පැහැදිලි වේ. මෙම කලා නිර්මාණ පහත පරිදි හඳුනාගත හැකි ය.
  - ගල් හා ලෝහ ප්‍රතිමා - ආභරණ හා මෙවලම්
  - මුද්‍රා - සෙල්ලම් බඩු
  - වාස්තු විද්‍යා නිර්මාණ
- හින්දි භාෂාවෙන් "මෙහොන් - ජො දාරෝ" යනු මළවුන්ගේ ගොඩැල්ලයි. එය වර්තමාන පකිස්ථානයට අයත් සින්ධිහි ලර්කානා දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- හරප්පාව වර්තමාන පකිස්ථානයේ බටහිර පන්ජාබ් ප්‍රදේශයේ මොන්ට්ගෝමරි දිස්ත්‍රික්කයේ රවි නදී ඉවුරේ පිහිටා ඇත.

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- පූජිත සිත්තරු - සොලමන් ප්‍රේමානන්ද


**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**